# සීමාසහිත දිවුලපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය

## තනතුරු / ඇබෑර්තු

සීමාසහිත දිවුලපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති තනතුර සඳහා සුදුසුකම් ලත් ගම්පහ දිස්ත්‍රික්කය තුළ වසර දෙකක ස්ථිර පදිංචිය සහිත අයදුම්කරුවන්ගෙන් 2023.01.13 දින සිට 2023.01.27 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | වැ.ප. අංකය හා ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|
| සාමාන්‍යාධිකාරී | 101 : 3 - III | 01 | 23,654-450X10-520X10-650X10 = 39654 |

02. මෙම තනතුර ස්ථිරය. සමුපකාර විශ්‍රාම වැටුප් අරමුදලට දායකත්වය හිමිය.

03. **බඳවා ගැනීමේ සුදුසුකම් :**

අ. 101 : 3 වැ.ප. ස්ථිර තනතුරක වසර දෙකක සතුටුදායක සේවා පළපුරුද්දක් හෝ 102 : 4 වැ. ප. ස්ථිර තනතුරක වසර තුනක සතුටු දායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ආ. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමග 102 : 5 වැ.ප. ස්ථිර තනතුරක වසර පහකට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

ඇ. රජයේ පිළිගත් ආයතනයක කළමනාකරණය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලා සහතිකය සමග අදාළ ක්ෂේත්‍රයේ විධායක / කළමනාකරණ මට්ටමේ වසර පහකට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම

හෝ

ඈ. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ සමග අදාළ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර තුනකට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

05. **වයස් සීමාව -** අවුරුදු 30 - 50

06. **බඳවා ගැනීමේ ක්‍රමය -** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

07. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර, බඳවා ගැනීමේ නීති රීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට පෙර හෝ පැවැත්වීමේදී හෝ පැවැත්වීමෙන් පසුව හෝ අයදුම්පත අවලංගු කළ හැකිය.

08. **අයදුම්පත්‍රය යොමු කිරීම**

i. අයදුම් පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"සීමාසහිත දිවුලපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම"** යන්න සඳහන් කළ යුතුය.

ii. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2023.01.27 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. (අතින් ගෙනැවිත් භාරදීමටද හැකියාව ඇත) මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

**සභාපති,**
**සීමාසහිත දිවුලපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය, දිවුලපිටිය.**
**2023.01.12 දින දිය.**